# කෙතට බසින කොළොම් පුරේ සිසු දරුවෝ

**‘කොළඹ දූප්පත් පවුල්වල පාසැල් දරුවන්ට පැලයක් හරි විදියට වවන හැටි ඉගෙන ගන්න ඔවුන් සතුබිම් අහලක් නැහැ. ඒත් ඔවුන් කෘෂිකර්මය දැඩි උනන්දුවෙන් හදරනවා. පාසැල් භූමියේ මේ කුඩා ගොවිපලයි ඔවුනට ඊට පිහිට වන්නේ’. – කොටහේනේ, සාන්තමරියා විද්‍යාලපතිනිය.**

‘සාර්ථක ලෙස පාසැල් කෘෂිකර්ම වැඩ සටහනක් මෙහෙය වන්න කෘෂිකර්ම දෙපා-ර්තමේන්තුවට උපකාරී වන වැදගත් සාධක යක් වන්නේ ඒ ඒ පාසැල්වල කෘෂිකර්මය සම්බන්ධව ඇති වී තිබෙන උනන්දුව යි’. මෙසේ පැවසුවේ අප සමඟ පසුගිය ද කොළඹ පාසැල් වැඩ සටහන් බලා ගන්න පිටත් වූ කෘෂිකර්ම උපදේශිකා ඊ. අබේවික්‍රම මහත්මිය යි. දැනට කෘෂිකර්ම දෙපාර්ත මේන්තුවේ අවුරුදු නවයක සේවාවක් නිම කර ඇති ඇය 1971 සිට කොළඹ පාසැල් වල මෙම කෘෂිකර්ම වැඩ සටහන් භාරව කටයුතු කරනවා.

❁ ❁ ❁ ❁

අප පළමුවෙන් ගිය කොටහේන සාන්ත මරියා විද්‍යාල පිහිටා තියෙන්නේ කුඩා ගෙවලින් පිරී ගිය ජනාකීර්ණ පෙදෙසක යි. එහි විද්‍යාලපතිනිය වන එස්. කොඩිතුවක්කු මහත්මිය අප සාදරයෙන් පිළිගත්තා. ‘මෙම පාසැලේ කෘෂිකර්ම වැඩ සටහන දැන් අප අවුරුදු 5–6 ක කාලයක් තිස්සේ උනන්දු වෙන් ඉදිරියට ගෙන යනවා. එයට අදාල හැම කාර්යයක් ම අප කරන්නේ ක්‍රමානු කූලව විමසා බලලා. උදාහරණයක් හැටියට පාසැලේ වගා සැලැස්ම මා පෙන්වා දෙන්න කැමතියි. මෙම වගා සැලැස්ම අප පිළියෙළ කලේ පාසැල් භූමියේ වගාවට යොදා ගන්න හරියේ පිහිටීම, පස යනාදී ලක්ෂණ අනුව යි. අපට ඊට කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙ සහාය නොමඳව ලැබුණා’. ඇය අප හා කළ සාකච්ඡාවේ දී පැවසුවා.

පාසැල් භූමියේ රතුපැණු, රාබු, ගෝවා වම්බටු, නිවිති යනාදි වගාවල සිසුන් සිරු වෙන් වැඩ. වැඩි කථාබහක්වත් නැහැ. ඔවුන් තුළ දැඩි ශික්ෂණයක් ඇති කර තිබෙනවා. තවාන් පිළියෙළ කිරීම, කොම්පෝස්ට් පෝර සෑදීම, මිශ්‍ර වගාව යනාදී අංශයන් පිළිබඳ පුහුණුවක් ඔවුනට ලැබෙනවා.

‘ළමයි බුෂිටාවො පාත්තිවල මල්වත්, මුල්වත් නොකඩා කාලය ඉතිරි කර වන මේ ක්‍රමයට වල් පැල ගල වන්න.’

‘මිශ්‍ර බෝග වගාව කරන කොට ඒ ඒ බෝගයට උවමනා ඉඩ ප්‍රමාණය අනුව පර තරය සලස්වා පාත්තිවල පැල සිට විය යුත්තේ’.

මෙසේ ළමුන් ගේ කටයුතු ගැන සැලකිලි මත් වන ගුරුන් ගෙන් උපදෙස් ලැබෙනවා.

**මෙදින විවිධ පාසැල් අතර සිසුනට ඔවු නොවුන් හමුවී එක්ව වැඩ කරලා ඔවුන් නොවුන් ගේ අත්දැකීම් හුවමාරු කර ගන්න හැටි දැක ගන්නට අපට අවස්ථාවක් ලැබුණා.**

කොටහේන සාන්ත මරියා විද්‍යාලයට එදින පැමිණුනේ පොල්පිති මූකලාන කණිෂ්ඨ විද්‍යාලේ 4–3–5 යන පන්ති වල සිසුන්. ඔවුන් සමඟ පැමිණි වර්ණකුලසූරිය මහත්මිය මේ සිසු අත්දැකීම හුවමාරුව පිළිබඳ සිය අදහස් පළ කලේ මෙසේ යි.

‘අප පාසැල පිහිටියේ වැඩිමනත් පොල් කොහු කර්මාන්ත කෙරෙන පෙදෙසක යි. එහි ක්‍රමවත් එළවළු වගාවක් කරන තැනක් නැති තරමට. ඒ නිසා ගොඩ බෝග වගා වට විශේෂ දස්කමක් දක්වන කොටහේන සාන්ත මරියා විද්‍යාලේ සිසුන් හමු වී ඔවුන් එක්ක වගා කටයුතු කරලා ඒ පිළිබඳ අව



සාන්ත ජෝසප් විද්‍යාලයේ සිසුන්ට උසස් විභාග උදෙසා කෘෂිකර්මය හදාරන්නට හැමවිට උනන්දු කරන වන වික්‍රමසිංහ පියතුමා කෘෂිකර්ම නිලධාරි තැන සමග සාකච්ඡාවක යෙදී සිටී.

**ඒ ඒ වෙලාවට කරන්න තියෙන දේ පැකිලෙන්නෙ නැතිව හිතත් ගතත් යොදල කරන්න ඔවුන්ව හැඩ ගස්වන්නයි අප වෙහෙසෙන්නෙ. අනාගත පරපුර එවිට නොබියව පෙරට එනු නිසැකයි.**

බෝධයක් ඔවුනට ලබාදීමයි, අද අප පැමිණි ගමනේ අරමුණ'.


මේ අන්දමින් දස්කම් පාන කොටහේන සාන්ත මරියා විද්‍යාලයේ සිසුන් වරක් පාසැලේ වත්තේ රතුළූණු හොණ්ඩර 112 ක් ලබා ගෙන තිබෙනවා. ඒ විතරක් නොවේ තවත් අවස්ථාවක ඔවුන් රාත්තල් 14 ක් බර වූ බතල අලයක් වැවීමට ද හැකි වී තිබෙනවා. මේ ප්‍රතිඵල නිසා 1972/73 කාලයේ ඔවුනට පාසැල් වල මාණ්ඩලික කෘෂිකර්ම තරගාවලියෙන් පළමු ස්ථානයත් දිස්ත්‍රික්



සාන්ත ජෝසප් විද්‍යාලයේ සිසුන් කෘෂිකර්ම දෙපාර්තමේන්තු උපදේශිකා අබේවික්‍රම මහත්මිය සමග මාළු මිරිස් පැලවලට රසායනික පොහොර සාදයි.



කොටහේනේ සාන්ත මරියා විද්‍යාලෙහි සිසුන් ගොඩ බෝග වගා කටයුතුවල නිරතව සිටී.



තරඟාවලියෙන් දෙවැනි ස්ථානයක් දිනා ගෙන තිබෙනවා.

❁ ❁ ❁ ❁

අප ඊළඟට ගියේ දනට පෞද්ගලික පාසැලක් වූ මරදානේ සාන්ත ජෝසප් විද්‍යාලයට යි. මෙම විද්‍යාලයට අයත් ගොවිපල කලින් පාපන්දු පිටියකි. වරක් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් එහි කෘෂිකර්ම ප්‍රදර්ශනයක් පැවැත්වූවා. එහි දී පාසැල ලත් ආදර්ශය නොකඩවා ඉදිරියට ගෙන යන්නට ගත් අධිෂ්ඨානයේ ප්‍රතිඵලයක් හැටියට එහි සිසුනට අද මේ ගොවිපල හිමි වී තිබෙනවා.

ගොවිපල මැදින් ම කුඩා කුඹුරක්. එය වටා එළවළු, කෙසෙල්, කෝපි වවලා. ගොවිපල එක පැත්තකින් කුකුළන් ඇති කරන ස්ථානය. අනිත් පැත්තේ මිරිදිය මසුන් බෝ කරන තටාකයක්.

එද තරමක වැසි දිනයක්. අප සාන්ත ජෝසප් විද්‍යාලයට යන විටත්, 'පුංචි මහත්වරු' කලිසම් කොට වල් ඇඳ ගෙන කුඹුරු කොටනවා. අක්කර 1/4 ක් පමණ වූ මේ කුඹුරෙන් බීජී 34–8 ගිය කන්නයේ වගා කළ බවත්, සතියකට ඉහත දී අස්වැන්න කපා ගත් විට බුසල් 20 ක් ලැබුණු බවත් ඔවුන් සාඩම්බරයෙන් පැවසුවා. ගම්බද සිසුනට වගේ නොවෙයි, උදැල්ල අල්ලන හැටි, රිද්මයකට අනුව කාණ්ඩ වශයෙන් කුඹුරු කොටන හැටි, මේ හැම එකක් ම ඔවුනට පුරුදු පුහුණු කරන්න සිදු වෙලා. නමුත් මේ සිසුවෝ දක්ෂ ලෙස ඊට පුරුදු වෙලා. ඔවුන් ගම්බද සිසුන් එක්ක ගොවිතැනට බැස්සොත් කරට කර තරඟයක් දීමට හැකි වනවා නො අනුමාන යි.

'ඒ ඒ වෙලාවට කරන්න තියන දේ පැකිලෙන්නෙ නැතිව හිතත් ගතත් යොදලා කරන්න ඔවුන්ව හැඩ ගස්වන්න යි අප වෙහෙසෙන්නේ. ඒ නිසා මේ දරුවො අනාගතයේ දී රට වෙනුවෙන් මොන දේට ඉදිරි පත් වුනත් පසු බසින අය නම් නොවන වග පැහැදිලි යි.' එසේ පැවසුවේ පාසැලේ මෙම අධ්‍යාපන වැඩ සටහන් භාර යූ. වික්‍රමසිංහ පියතුමන්.

''රසායනික පොර දන අත්වලින් පැල අල්ලන්න එපා. ඒවයේ සැර වැදිලා පැල මැරෙන්න පුළුවනි.'' ඒ හඬ ආවේ කුඹුරු වලට එහායින් එක දිගට තිබෙන මාළු මිරිස් පාත්ති වලින්. කෘෂිකර්ම උපදේශිකාව හා ගුරුවරුන් සිසුන් එක්ක බරට ම වැඩ.

මෙම ගොවිපලේ බෝගවලින් වසරකට ලබන ආදායම රු. 3,000.00 ක් ඉක්මවනවා. ආදි ශිෂ්‍යයින් පරිත්‍යාග කර ඇති ජල පොම්පවල උදව් වියළි කාලවලත් එක වගේ වැවීම කර ගන්න පුළුවනි.

අපට පෙනී ගිය තවත් කරුණක් කෘෂිකර්මය පිළිබඳ සිසුන් ගේ විමසිලිවන්ත භාවය යි. ඔවුන් හැම දෙයක් ගැන ම වගේ කෘෂිකර්ම නිලධාරිතැන හා ගුරු මහතුන් ගෙන් ප්‍රශ්න විමසුවා.

හැම පැලයකට ම එක වගේ පොර යෙදුවත්, පස බුරුල් කිරීම, වල් පැල නෙලීමාදිය කලත් කුඹුරත් මිරිස් පාත්තියත් වෙන් කරන අඩි පාර අසල සිට ඈතට යන්න යන්න පාත්තිවල මිරිස් පැලත් පොඩියි, වැඩීමත් අඩු යි, පලදාවත් මදි යි. මේක සිසුනට ප්‍රශ්නයක් වුනා. අප සමඟ ගිය කෘෂිකර්ම නිලධාරි දල්පතාදු මහතා එය විස්තර කර දුන්නා. ''මේක ලෝකේ හැම තැනම වගාවල දක්නට තිබෙන දෙයක්. ඊට ඉංග්‍රීසියෙන් කියන්නේ 'ඉන්ස්පෙක්ෂන් ලෙවල්' කියලා. නැතිනම්, 'පරීක්ෂා මට්ටම' යන්න පුළුවන්. උදාහරණයක් හැටියට ගෙවල් ළඟ තිබෙන පොල් ගස්වල පලදාව වැඩියි, වත්තක තිබෙන සාමාන්‍ය පොල් ගසකට වඩා. අපට නොදැනුවත්වම ළඟ තිබෙන පැලයට වැඩි සැලකිල්ලක් ලැබෙනවා.''

දැන් සාන්ත ජෝසප් විද්‍යාලේ ඒ සිසු ගුරු උනන්දුව නිසා ලබන වසරේ පටන් කෘෂිකර්ම උසස් පෙළටත් විෂයයක් හැටියට සිසුන්ට හදාරන්න කටයුතු සකස් කරගෙන යනවා.